ET/SSS/2022(2023)/OL/64/S/Q/S-2

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Second Language - Sinhala

# දෙවන බස - සිංහල



**Question Paper - I, II** | வினாப்பத்திரம் - I, II (மொழிமூலம்-தமிழ்)

Nenasa

The National e-learning Portal for The General Education

මෙහෙයවීම: දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය: ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 64 | S | I, II |
|---|---|---|

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர்- 2022 (2023)
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

දෙවන බස සිංහල I, II
இரண்டாம் மொழி சிங்களம் I, II
**Second Language** Sinhala I, II

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

දෙවන බස සිංහල I

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

***கவனிக்க வேண்டியவை :***

* *சகல வினாக்களுக்கும் விடையளிக்க.*
* *1 தொடக்கம் 40 வரையான விடையளிக்கு வழங்கப்பட்டுள்ள விடைகளுள் சரியான லல்லது மிகப் பொருத்தமான விடையினைத் தெரியு செய்க.*
* *உங்களுக்கு வாலங்கப்புடும் விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் தரப்பட்டுள்ள வட்டங்களுள் தெரிவுசெய்த விடைக்குப் பொருத்தமான வட்டத்திற்கு புள்ளடி (X) இடவும்.*
* *அவ்விளைத்தாளின் மறுபக்கத்தில் தரப்பல்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்துப் பின்பற்றுக.*

**Instructions:**

* Answer **All** questions.
* In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which is **correct or most appropriate**.
* **Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet provided.**
* Further instructions are given on the back of the answer sheet. Follow them carefully.

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.
  **1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.
  Select the most suitable pair of word for the word printed in bold letters in questions from No.1 to5.

1. මගේ අතේ තුවාලයට **බෙහෙද්නැද් ද?**

   (1)බෙහෙද් නැති ද? (2) බෙහෙත් නැද්ද ? (3) බෙහෙත නැද් ද? (4) බෙහෙත නැතිද?

2. ජලය අපතේ **අරින්නෙපා**

   (1) අරින්න එපා (2) අරින්න නෙපා (3) අරින් එපා (4) අරින් නෙප්පා

3. මට ඔයාව **ජේන්නෑ**

(1) ජේන්නේ නෑ (2) ජේන් නැහැ (3) ජේනවා නෑ (4) ජේන්නෑ නැහැ

මට අද ගගේ **පීනන්නෝනා**

(1)පීනන්න නෝනා (2) පීනන්න ඕනා (3) පීනන්නට ඕනා (4) පීනන් ඕනා

5. මං හෙට **බාප්පත්තෙක්ක** කොළඹ යනවා

(1) බාප්පා එක්ක (2) බාප්පා තෙක්ක (3) බාප්පත් එක්ක (4) බාප්පාත් තේක්ක

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරින් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
  6 தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் விடையைத் தெரிவு செய்க.
  Select the answer with **correct pronunciation** from the words given in questions from No.**6**to **10.**

6. (1) වැටසටහන (2) වෙඩසටහන (3) වැඩසටහන (4) වෙඩසඩහන

7. (1) හෙටඅට (2) හැටඅට (3) හැටඑට (4) හැටඅඩ

8. (1)ගංකාව (2) ගන්ගාව (3) ගන්කාව (4) ගංගාව

9. (1) ග්‍රාම නිලධාරි (2) ගිරාම නිලධාරි (3) ග්රාම නිලධාරි (4) ග්‍රම නිලධාරි

10. (1) කතන්දරය (2) කදන්දරය (3) කතන්තරය (4) කදන්තරය

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශ සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
- **11** தொடக்கம் 14 வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவு செய்க.
- Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

11. මේ මගේ ලොකු තාත්තා
    (1) මේ ඔයාගේ කව්ද ? (2) මේ ඔයාද ?
    (3) මේ ඔයාගේ කාටද ? (4) මේ ඔයාගේ කාගෙද ?

12. එයා ඉන්නේ ගම්පහ
    (1) එයා ඉන්නේ කොහොම ද ? (2) එයා ඉන්නේ මොනවට ද ?
    (3) එයා ඉන්නේ කොහේ ද ? (4) එයා ඉන්නේ කොතනට ද ?

13. ටිකට් පහක් දෙන්න.
    (1) ටිකට් කීයක් ඕනද ? (2) ටිකට් පහක් ඕන ද ?
    (3) ටිකට් පහක් ගත්ත ද ? (4) ටිකට් පහක් දුන්න ද ?

14. මල්ලී අයියා සමග කඩේට යනවා
    (1) මල්ලී යන්නේ කවු ද ? (2) මල්ලී යන්නේ කා සමග ද ?
    (3) මල්ලී යන්නේ කාට ද ? (4) මල්ලී යන්නේ කවරෙක් ද ?

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදිව අකුරු** යෙදී ඇති පදය තෝරන්න.
  **15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக்கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவு செய்க.
  Select the answer with **correct spelling** in questions No. **15** to **17**.

**15.** (1) සංවර්දනය (2) සංවර්ධනය (3) සංවර්දණය (4) සංවර්ධණය
**16.** (1) විණාශය (2) විනාසය (3) විනාශය (4) විනාෂය
**17.** (1) තාක්ෂණය (2) තාක්සණය (3) තාක්ෂනය (4) තාක්ශණය

- අංක **18** සිට **20** තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන පදය** තෝරන්න.
  **18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவுசெய்க.
  Select the **inappropriate** word in question No. **18** to **20**.

**18.** (1) ඔරුව (2) පාරුව (3) බෝට්ටුව (4) හබල
**19.** (1) කඩියා (2) දිවියා (3) කුඹියා (4) දිමියා
**20.** (1) අල (2) බතල (3) බෝංචි (4)ගහල

- අංක 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்டசொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.

**21.** දිනපතා (1) ඉදහිට (2) හැමදාම (3) කලාතුරකින් (4) මාසික
**22.** වර්ණය (1) පැහැය (2) දුර්වර්ණ (3) අවර්ණ (4) පැහැදිලි
**23.** ප්‍රතිමාව (1) ප්‍රමුඛ (2) ප්‍රාතිහාර්ය (3) පිළිමය (4) ප්‍රතිරූප

- අංක 24 සිට 25 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **24,25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **எதிர்க் கருத்தைத் தரும் சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

24 උචිත (1) ගැළපෙන (2) අවචිත (3) සුචිත (4) අනුචිත
25 මෙතෙර (1) පරතෙර (2) එතෙර (3) පතර (4) කතර


- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන ප්‍රකාශය** තෝරන්න.
  **26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கருத்தைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
  Select the option that given at the **most suitable idea** for the picture given in each question from **No. 26 to 28.**

26. 


(1) වාහන ඇතුල් වීම තහනම්.
(2) වාහන නවතා තබන ස්ථානයකි.
(3) වාහන නවතා තැබීම තහනම්.
(4) වාහන ඉස්සර කිරීම තහනම්.

27. 

(1) මෙහි ජලය අපතේ නොහරින්න.
(2) ජල කරාමය ඇර තබා ඇත.
(3) දෑත් සෝදන්න එපා.
(4) හොඳින් දෑත් සෝදන්න.

28. 

(1) සුනඛයන් ඇල්ලිය හැකිය.
(2) සුනඛයන්ගෙන් ප්‍රවේශම් වන්න.
(3) සුරතල් සතුන් විකුණනු ලැබේ.
(4) සුරතල් සතුන් රැගෙන ආ හැකිය.

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
**29,30 ஆகிய வினாக்களுக்குப் பொருத்தமான விடையைத்** தெரிவுசெய்க.
Select the **suitable answer** for questions No. **29** and **30**.

29. වෙළෙඳසැල් වලින් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තා
(1) වෙළෙන්දා (2) පාඨකයා (3) පාරිභෝගිකයා (4) රසිකයා

30. අම්මාගේ නංගි මගේ කවුද ?
(1) නැන්දා (2) නැන්දම්මා (3) ලොකුඅම්මා (4) පුංචි අම්මා

- අංක 31 සහ 32 යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදිව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍ය** තෝරන්න.
**31,32** ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் சரியாக இணைத்து ஒரு வாக்கியமாக்கி **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவுசெய்க.
In questions No. **31** and **32**, two sentences each are given. Select the **sentence** that **correctly** combines the two sentences.

**31.** ගුරුතුමා කරුණු විස්තර කරයි. ගුරුතුමා පාඩම උගන්වයි.
(1) ගුරුතුමා පාඩම උගන්වමින් කරුණු විස්තර කරයි.
(2) ගුරුතුමා පාඩම උගන්වා කරුණු විස්තර කරයි.
(3) ගුරුතුමා කරුණු විස්තර කරමින් පාඩම උගන්වති.
(4) ගුරුතුමා කරුණු විස්තර කරමින් පාඩම උගන්වයි.

**32.** ළමයි පාඩම් කළෝය. ළමයි ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිව්වෝය.
(1) ළමයි පාඩම් කර ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිව්වෝය.
(2) ළමයි පාඩම් කරමින් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිව්වෝය.
(3) ළමයි ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට පාඩම් කළෝය.
(4) ළමයි ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියා පාඩම් කළෝය.

- අංක 33 සහ 34 ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
**33, 34** ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.
Select the **most suitable answer** to fill in each blank in qstions No.**33** and **34**.

**33.** මට ඊයේ …………………….. මිලදී ගන්න බැරි වුණා.
(1) පෑනට (2)පෑනකින් (3) පෑනකට (4) පෑනක්

**34.** මට …………………….. ටිකට් දෙකක් දෙන්න.
(1) දහයයි (2) දහයේ (3) දහයක් (4) දහය

- අංක **35.** ප්‍රශ්නයේ **කළු කර** ඇති සංඛ්‍යාව නිවැරදිව අකුරෙන් ලියා ඇති උත්තරය තෝරන්න.
  **35 ஆம் வினாவில் தடித்த எழுத்திலுள்ள** எண் சரியான எழுத்துகளால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவுசெய்க.
  Select the answer in which the number in **bold** print has been written in letters correctly in question No. **35**.

**35.** අපේ ගමේ පවුල් **1465** පමණ ජීවත් වෙති.

(1) එකයි හාරසිය හැට පහයි. (2) එක්දහස් හතර හැට පහයි.
(3) එක්දහස් හාරසිය හැට පහයි. (4) එක්දහස් හාරසිය හය පහයි.

- අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයේ ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.
  **36** தொடக்கம் **40** வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கணரீதியான சரியான** வாக்கியத்தைத் தெரிவுசெய்க.
  Select the **grammatically correct** sentences in each question from No. **36** to **40**.

**36.**
(1) අපේ ක්‍රීඩා නිවාස තුනක් හදමු.
(2) අපිත් ක්‍රීඩා නිවාස තුනක් හදමු.
(3) අපි ක්‍රීඩා නිවාස තුනක් හදමු.
(4) අප ක්‍රීඩා නිවාස තුනක් හදමු.

**37.**
1) ගුරුවරුන් උපහාර උළෙලට සහභාගී වූවාය.
(2) ගුරුවරු උපහාර උළෙලට සහභාගී වූයේය.
(3) ගුරුවරුන් උපහාර උළෙලට සහභාගී වූහ.
(4) ගුරුවරු උපහාර උළෙලට සහභාගී වූහ.

**38.**
(1) තරගකරුවෝ තරග බිමට පැමිණියෝය.
(2) තරගකරුවෝ තරග බිමට පැමිණියේය.
(3) තරගකරුවෝ තරග බිමට පැමිණියාය.
(4) තරගකරුවෝ තරග බිමට පැමිණියෙමු.

**39.**
(1) ගස් සුළඟට වේගයෙන් සෙලවෙති.
(2) ගස් සුළඟට වේගයෙන් සෙලවෙන්නෝය.
(3) ගස් සුළඟට වේගයෙන් සෙලවෙයි.
(4) ගස් සුළඟට වේගයෙන් සෙලවෙන්නීය.

**40.**
(1) කාන්තාවක් පොළෙහි බඩු විකුණුවේය.
(2) කාන්තාවක පොළෙහි බඩු විකුණුවේය.
(3) කාන්තාවක පොළෙහි බඩු විකුණුවාය.
(4) කාන්තාවක් පොළෙහි බඩු විකුණුවාය.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education, Sri Lanka**

| 64 | S | I, II |
|---|---|---|

දෙවන බස සිංහල I, II
*இரண்டாம் மொழி சிங்களம்* I, II
**Second Language** Sinhala I, II

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**දෙවන බස සිංහල II**

- I කොටසෙහි ප්‍රශ්න **දෙකටත් II** කොටසෙහි **එක්** ප්‍රශ්නයකටත්, **III** කොටසෙහි ප්‍රශ්න **දෙකටත්** වශයෙන් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- *பகுதி* **I** *இலுள்ள* **இரண்டு** *வினாக்களுக்கும் பகுதி* **II** *இல் இறந்து ஏதேனும்* **ஒரு** *வினாவுக்கும் பகுதி* **III** *இலுள்ள* **இரண்டு** *வினாக்களுக்குமாக மொத்தம்* **ஐந்து** *வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.*
- Answer only **five** questions including the **two** questions in part **I** and selecting **one** question from part **II** and **two** questions in part **III**.

1. දී ඇති මාර්ගෝපදේශ ඇසුරු කරගෙන පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන **100 ක** පමණ රචනයක් ලියන්න.
**பின்வரும் தலைப்புகளுள் ஒன்றைத் தெரிவு செய்து அதன் கீழே தரப்பட்டுள்ள விடயங்களை அடிப்படையாகக் கொண்டு ஏறத்தாழ 100 சொற்களில் அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.**
Write an essay of about **100 words** on one of the following topics using the given guidelines.

(අ) පොදු දේපල ආරක්ෂා කරමු,
(i) හැඳින්වීම.
(ii) පොදු හා පෞද්ගලික දේපළ හැඳින්වීම.
(iii)ඒවා සුරකින අන්දම.
(iv)ඉන් ලැබෙන යහපත.
(v) සමාලෝචනය.

(ආ) මා වෛද්‍යවරයෙකු වුවහොත්,
(i) හැඳින්වීම.
(ii) වෛද්‍ය වෘත්තියේ ඇති වටිනාකම.
(iii)සිදු කරන සමාජ මෙහෙවර.
(iv)ඊට කැමති වීමට හේතු හා ඉටුකරන යුතුකම්.
(v) සමාලෝචනය.

(ඉ) අන්තර්ජාලය හා ළමා පරපුර,
(i) හැඳින්වීම.
(ii) අන්තර්ජාලය මගින් ලැබෙන ප්‍රයෝජන.
(iii)එය නිවැරදිව පාවිච්චි කිරීම.
(iv)වාසි අවාසි.
(v) සමාලෝචනය.

(ඊ) පොත් කියවමු. පරිපූර්ණ මිනිසකු වෙමු,

(i) හැඳින්වීම.
(ii) කියවීම මගින් මිනිසාට ලැබෙන දැනුම.
(iii)කියවීම දියුණු කර ගැනීමට ලබාගත හැකි මූලාශ්‍ර.
(iv)ඉන් ලැබෙන සමාජ දියුණුව.
(v) සමාලෝචනය.

(උ) වැසි දවසක්

(i) හැඳින්වීම.
(ii) වැසි දවසක දී සිදු වන පාරිසරික වෙනස්කම්.
(iii)මා එම දිනයේ දී විඳි සුන්දරත්වය.
(iv)හානි හා ඒවා මිනිසාගේ එදිනෙදා කාර්යයන්හි දී බලපෑ අයුරු.
(v) සමාලෝචනය.

2. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක් වත් තිබිය යුතුය.)
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக. (ஒரு வாக்கியத்தில் குறைந்த பட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்.) Compose **five** meaningful sentences with references to the given picture .( There should be at least **four** words in a sentence).



## II කොටස - பகுதி II - Part II

- අංක **3 හා 4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
  **3 ஆம் 4 ஆம் வினாக்களுள் ஏதேனும் ஒரு வினாவுக்க மாத்திரம் விடை எழுதுக.**
  Answer only **one** question from question No. **3** and **4.**

පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

2. பின்வரும் கவிதையை வாசித்து,கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
   Reade the following poem and answer the questions given.

පාට පාට මැණික් ජාති
පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින්
ධන නිධාන මතුවේ

මහවැලි නිල්වලා ගඟයි
කළු වළවේ කැලණි ගඟයි
ගමින් ගමට ගලා ගොසින්
ගොඩයි මඩයි පොහොර කරයි

සීගිරියේ මෙන් දොරකඩ
සිටින සුරංගනාවෝ
දෝත පුරා මල් අරගෙන
අපට සුවඳ ගෙනාවෝ

නිල් පලසක් එලුවා සේ
රුහුණු රටේ වෙල් යායයි
පියගැටපෙළ කැපුවා සේ
උඩරට පොඩි ලියැදි පෙළයි

(i) මෙම ගීතයේ සඳහන් පරිදි එන නිධාන මතුවන්නේ කොහෙන් ද?
(ii) මෙහි සඳහන් ගංගා දෙකක් නම් කරන්න.
(iii)මෙහි සඳහන් සුරංගනාවෝ සිටින්නේ කොහේ ද?
(iv)පියගැටපෙළ කැපුවා සේ දිස් වෙන්නේ කුමක් ද?
(v) පහත වචන සඳහා සමාන පද කවියෙන් සොයා ලියන්න.
    (i) කුඹුර ………… (ii) වර්ණ ………..

4. පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
   **பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.**
   Answer the given questions with reference to the following prose text.

මමත්, අම්මත්, නංගිත් උදෑසනින්ම කොළඹ කොටුව දුම්රිය ස්ථානයට පැමිණියෙමු. ඒ බදුල්ලේ යෑමටයි. තාත්තා ප්‍රවේශ පත් මිලදී ගත්තේය. දුම්රිය කාලසටහන ද කියවා බැලුවේය. අපි ගමන් මළු රැගෙන බදුලු දුම්රිය නවත්වන වේදිකාවට ගියෙමු. ශබ්ද විකාශණ යන්ත්‍රයෙන් වරින්වර දුම්රිය ගමන් තොරතුරු නිවේදනය විය. "පස්වන වේදිකාවේ නවත්වා ඇති දුම්රිය තව ස්වල්ප වේලාවකින් ගාල්ල බලා පිටත් වේ. එය කොළඹ කොටුවේ සිට ගාල්ල දක්වා සෑම දුම්රිය ස්ථානයකම නතර කරනවා ඇත". නංගිත්, මමත් ඒ නිවේදනයේ වාක්‍යයක් දෙකක් තාලයට කියා විනෝද වුණෙමු. නංගි නිවේදන අසමින් තම සටහන් පොතේ දුම්රිය ස්ථාන වල නම් ලියා ගත්තා ය. ගමනක් යද්දී අවට ඇති දැන්වීම්, නාම පුවරු කියවීම් ද ඇගේ පුරුද්දකි.

(i) මෙම ඡේදයේ සඳහන් දුම්රිය ස්ථානය කුමක් ද?
(ii) මෙහි සඳහන් පුද්ගලයින් ගමන් මළු රැගෙන ගියේ කොහේට ද?
(iii)නිවේදනයේ සඳහන් දුම්රිය ගමන් කරන්නේ කුමන නගරයට ද?
(iv)ඡේදයේ සඳහන් නංගීගේ පුරුද්ද කුමක් ද?
(v) "ටිකට් පත" යන්නට සමාන පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

**III කොටස - பகுதி III - Part - III**

- අංක 5 හා හය යන ප්‍රශ්න දෙකට ම උත්තර ලියන්න.
  **5,6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
  Answer both questions No. **5** and **6.**

5 ගෝනදූව මහා විද්‍යාලයේ වාර්ෂිකව පවත්වන ත්‍යාග ප්‍රදානෝත්සවය 2023.06.08 දින පෙරවරු 09:30 ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට පාසල් සංවර්ධන සමිතිය කටයුතු සංවිධානය කර ඇත. එම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය සහභාගී වේ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා දෙමාපියන් ආදී ශිෂ්‍යයන්ගේ සහභාගිත්වය එදින අපේක්ෂා කෙරේ.

ඉහත තොරතුරු ඇතුළත් කොට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.
மேற்குறிப்பிட்ட விடயங்களை கருத்தில் கொண்டு அறிவித்தல் ஒன்றை தயார் செய்க
Prepare a notice based on the above details

නැතහොත්
அல்லது
Or

ඔබ ප්‍රදේශයේ ඩෙංගු රෝගය ශීඝ්‍රයෙන් පැතිරෙමින් තිබේ. එම රෝගය පැතිරීම වැළැක්වීම සඳහා "දිලෙන තරු" ක්‍රීඩා සමාජය විසින් ප්‍රදේශයේ ශ්‍රමදානයක් සංවිධානය කර තිබේ. එම ශ්‍රමදානයෙන් ඉවත් කරන කුණු කසළ බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපතිට යවන ලිපිය සකස් කරන්න. "දිලෙන තරු" ක්‍රීඩා සමාජයේ ලේකම් ඔබ යැයි සිතන්න.

ඉහත තොරතුරු ඇතුළත් කොට සුදුසු ලිපියක් සකස් කරන්න.
மேற்குறிப்பிட்ட விடயங்களை கருத்தில் கொண்டு கடிதம் ஒன்று எழுதுக.
Prepare a letter based on the above details.

6. පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රිසි වාක්‍ය හෝ සිංහලයට පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் அல்லது ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழி பெயர்க்க.
Translate the following Tamil / English sentences into **Sinhala.**

(i) நாங்கள் திருகோணமலைத் துறைமுகத்தைப் பார்வையிட்டோம்.
(ii) நாம் மதவழிபாட்டுத் தலங்களில் ஒழுக்கமாக நடந்துகொள்வோம்.
(iii)வண்ணத்துப் பூச்சிகள் வானில் பறக்கின்றன.
(iv)பொது இடங்களில் முகக் கவசம் அணிவோம்.
(v) சிறுவர்கள் சத்துள்ள உணவுகளை உண்ண வேண்டும்
(vi) We visited the harbour at Trincomalee.
(vii) Let's behave decently at places of religions worship.
(viii) Butterflies fly in the sky.
(ix) Let's wear Face mask at public places.
(x) Children shoud eat a healthy food.

නැතහොත්
அல்லது
Or

පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන සංවාදයක් ලියන්න. වාක්‍ය 10 ක් ප්‍රමාණවත් වේ.
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக.
(10 வாக்கியங்கள் போதுமானவை)
Write a dialogue based on the following information. (10 sentenses are enough.)

සත්සරගේ අම්මා සමේ රෝගයකින් පෙළෙයි. ඇය සමේ රෝග විශේෂඥ වෛද්‍යවරයාට පෙන්වීමට ඔහු අදහස් කරයි. ඔහු "සුවනි" පෞද්ගලික රෝහලට අමතා අංකයක් වෙන්කරවා ගැනීමට අදහස් කරයි. ඔබ සත්සර යැයි සිතා පෞද්ගලික රෝහලට අමතන අවස්ථාව දෙබසකට නගන්න. ඒ සඳහා පහත කරුණු උපයෝගී කර ගන්න.

- රෝහලට දුරකතන ඇමතුමක් ලබාදීම
- රෝහලේ පිළිගැනීමේ නිලධාරිනිය පිළිතුරු දීම.
- විස්තර ලබා දීම හා අංකය වෙන් කර ගැනීම.
- ස්තුති කිරීම.

*****